**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2022.11.10 වන දින පැවැති මාසික මහා සභා රැස්වීම් වාර්තාව.**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මාසික මහා සභා රැස්වීම 2022 නොවැම්බර් මස 11 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | | |
|---|---|---|---|
| 02. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා. |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා. |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.වී.ආරියරත්න මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.එස්.දීප්ති ධර්ම ශ්‍රී මැතිතුමා. |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමා. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.බිමල්ක ප්‍රමෝද්‍යා මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.වී.අජිත් නිශාන්ත මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.එම්.හේමන්ත පෙරේරා මැතිතුමා. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.ඉන්දික මැතිතුමා. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමා. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඊ.චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමා. |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.පියසේන මැතිතුමා. |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.චමින්ද ගුණරත්න මැතිතුමා. |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සුරවීර මැතිතුමා. |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ටී.රිද්මා අනුරුද්ධිකා ධර්මවර්ධන මැතිතුමිය. |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය. |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා. |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සෙල්වනායගම් රගවන් මැතිතුමා. |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජී.අනෝමා ප්‍රියදර්ශනී ගාල්ලගේ මැතිතුමිය. |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ඩී.පුෂ්පලතා වැලිකල මැතිතුමිය. |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ටී.මෝහන්දාස් මැතිතුමිය. |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා. |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.ඉන්දික කුමාර දිසානායක මැතිතුමා. |
| 32. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා. |
| 33. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එල්.එස්.දයාල් චමින්ද කුමාර මැතිතුමා. |
| 34. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , රණවිරුවන් සිහිකිරීමෙන් පසුව ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු විපක්ෂනායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද, ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**01. පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම. ( 2022.10.13)**

2022.10.13 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා සංශෝධන ඇතොත් ඉදිරිපත් කිරීමටත් , සංශෝධන නොමැති නම් එම වාර්තාව සභා සම්මත කිරීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ඒ අනුව 2022.10.13 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමන් විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදනය.**

**03. සභාව අමතා එවන සංදේශ, මහජන පෙත්සම්/පැමිණිලි සභාව ඉදිරියේ තැබීම.**

පැල්මඩුල්ල පොදු වෙළඳපොළ අංක 14 දරණ මාළු කඩය 2022 වර්ෂය සඳහා බදු ගෙන ඇති බදුකරුට බදු මුදල් ගෙවීමට නොහැකි වීම හේතුවෙන් අදාළ බදු ගිවිසුම අවලංගු කර ඇති අතර , එම ටෙන්ඩරයට අදාල අනෙකුත් ලංසුකරුවන් ද මෙම කඩ කාමරය ප්‍රතික්ෂේප කර ඇති බැවින් නැවත ටෙන්ඩර් කැඳවා ඇතත් , කිසිදු ලංසුකරුවෙකු ඉදිරිපත් වී නොමැති බැවින් මාසිකව රු.22,500.00 ක ගාස්තුවක් අය කර ගැනීමේ පදනම මත මෙම වර්ෂයේ ඉදිරි කාල සීමාව සඳහා පැල්මඩුල්ල පොදු වෙළඳපොළ අංක 14 දරණ මාළු කඩ කාමරය බදු දීමට ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති ලිපිය ගරු සභාවට ඉදිරිපත් කිරීම.

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.**

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**I. <u>ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ යෝජනා.</u>**

**01.** රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් අංක RT/RP/1734 හා 2022.10.13 වන දිනැති ලිපියෙන් 2023 වර්ෂයේ සිට ඉදිරි වසර 3ක කාලයක් දක්වා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් පොදු වෙළෙඳ සංකීර්ණයේ කඩ කාමර අංක 01 සිට 14 දක්වා මාසික වෙළෙඳපොළ කුළිය වශයෙන් රු.7,000.00 ක් ( හත්දහසක් ) බැගින් අය කිරීම සුදුසු බවට තක්සේරු කර වාර්තා කර ඇති අතර එය අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 01**
රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් අංක RT/RP/1734 හා 2022.10.13 වන දින ඉදිරිපත් කර ඇති තක්සේරු වාර්තාව සලකා බලා 2023 වර්ෂයේ සිට ඉදිරි වසර 3ක කාලයක් දක්වා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් පොදු වෙළෙඳ සංකීර්ණයේ කඩ කාමර අංක 01 සිට 14 දක්වා මාසික වෙළෙඳපොළ කුළිය වශයෙන් රු.7,000.00 ක් ( හත්දහසක් ) බැගින් අය කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**02.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ දීර්ඝ කාලයක් තුළ පැවති පියවා ගත නොහැකි හිඟ සේවක ණය මුදල් කපා හැරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම ඉදිරිපත් කරමි.

සටහන 01 - පහත නම් සඳහන් අයගෙන් අය කර ගත යුතු රු.12308.00 මුදල ඔවුන් ජීවතුන් අතර නොමැති බැවින් අය කර ගත නොහැකිව පවතී.

1. බෝවත්තේ ඉන්දරතන හිමි රු.7500.00
2. අමිත සෙනෙවිරත්න මයා රු.1208.00
3. ජී.කේ. රූපසිංහ මයා රු.3600.00

ඉහත සඳහන් ස්වාමීන් වහන්සේ/නිලධාරීන් මේ වන විට මිය ගිය බව තහවුරු කර ගෙන ඇත.

එසේම එම්.ජී.චන්ද්‍රසේන මහතා මෙම ආයතනයේ සේවය කරන කාලය තුළ ලබාගත් රු.42730.00 ක ණය මුදලක් පවතින බවට ලේඛනවල සඳහන්ව තිබුණ ද ඒ මහතා පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ස්ථාන මාරුවී ගොස් ඇති අතර ප්‍රාදේශීය ලේකම්ගේ පැ/ප්‍රා/ලේ/ගි/6/1/11 හා 2010.06.28 දිනැති ලිපිය මඟින් ණය ශේෂයක් නොපවතින බව දන්වා එවා ඇත.තවද සුරාජ් අලහකෝන් මහතා විදෙස් ගතව ඇති හෙයින් ඔහු මෙම ආයතනයෙන් ලබා ගෙන ඇති ණය මුදලින් හිඟ ශේෂය වන රු.3200.00 ක මුදල අය කර ගැනීමට කිසිඳු ක්‍රමවේදයක් නොමැත.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ මේ සම්බන්ධව තොරතුරු සෙවීමේ දී ඉහත සඳහන් තොරතුරු ලබා ගැනීමට හැකි වූ බවත් , නමුදු එම මුදල් අය කර ගැනීම සඳහා කිසිදු ක්‍රමවේදයක් නොමැති බවත් , බැංකු සැසඳුම් වල මෙම හිඟය පෙන්වන බවත් , විගණනයේදී ද මේ සම්බන්ධව විමසන බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසා සිටියේ එම්.ජී.චන්ද්‍රසේන මැතිතුමා තමන්ගේ ඥාති වන බවත් , ප්‍රාදේශීය ලේකම්ගේ පැ/ප්‍රා/ලේ/ගි/6/1/11 හා 2010.06.28 දිනැති ලිපිය මඟින් ණය ශේෂයක් නොපවතින බව දන්වා එවා ඇති බවත් , හිඟ සේවක ණය මුදල් ගෙවීමට ඇත්නම් එතුමාගේ දරුවන් හෝ ගෙවීමට කැමැත්ත පළ කරන බවත් , මෙම දත්තයන් නිවැරදිව ලේඛන වල සටහන් වූවා නම් මෙවැනි ගැටළු මතු නොවන බවත් , ඉදිරියට මෙවැනි ගැටළු ඇති නොවීමට කටයුතු කළ යුතු බවත් ය.

මේවා තමන් සභාපති ලෙස පත්වීමටත් පෙර සිට පැවත එන ගැටළු බවත් , ලේඛන වල පවතින මෙවැනි ගැටළු විසඳීමට නිලධාරීන් උත්සාහ ගන්නා බවත් , ඊට පසු ලේඛන වල මෙවැනි ගැටළු නොපවතින බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

**තීරණ අංක 02**
ඉහත සටහන සලකා බලා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ දීර්ඝ කාලයක් තුළ පැවති පියවා ගත නොහැකි ඉහත නම් සඳහන් නිලධාරීන්ගේ හිඟ සේවක ණය මුදල් කපා හැරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**03.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග නඩත්තු කර ගෙන යාම දැනට ගැටළුවක් වීම හේතුවෙන් 2023 වර්ෂයේ සිට මෙම තත්වය නිරාකරණය කර ගැනීම සඳහා ප්‍රිමික්ස් නිෂ්පාදනය කර අලුත්වැඩියා කටයුතු කිරීමටත් , ඒ සඳහා අවශ්‍ය ඩබල් ඩ්‍රම් රථයක් ඇතුළු උපකරණ මිල දී ගැනීමටත් මහා සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ ඉතා වැදගත් මෙම ව්‍යාපෘතිය සඳහා ඩබල් ඩ්‍රම් රථයක් පමණක් නොව ප්‍රිමික්ස් ව්‍යාපෘතියට අදාල සියලු උපකරණ ලබා ගැනීමට කටයුතු කළ යුතු බවය.මෙමඟින් මාර්ග නඩත්තුවට යන විශාල මුදලක් ඉතිරි කර ගත හැකි බවත් , මාර්ගයෙහි පවතින සුළු අලුත්වැඩියාවන් එම අවස්ථාවේදීම සිදු කළ හැකි වීමෙන් තවත් දීර්ඝ කාලයක් මෙම මාර්ගය පරිහරණය කිරීමට ජනතාවට ඉඩ සැලසෙන බවත් ය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ “ ඩබල් ඩ්‍රම් රථයක් ඇතුළු උපකරණ මිල දී ගැනීමට ” ලෙස යෝජනාවෙහි ඇතුලත් කර ඇත්තේ අවශ්‍ය සියලු උපකරණ ලබා ගැනීම සඳහා වන බව ය.ජනවාරි මස මෙම ප්‍රිමික්ස් නිෂ්පාදන කටයුතු ආරම්භ කළ යුතු බවත් , අවශ්‍ය කටයුතු මෙම මාස දෙක ඇතුලත සිදු කළ යුතු බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ මෙය සුදුසු බවත් , නැතිනම් පොඩි ගල් තාච්චියකින් වැසීමට ඇති දේ වෙනුවෙන් ද විශාල මුදලක් වැය කිරීමට සිදු වන බවත් , හොඳ ව්‍යාපෘතියක් බවත් ඒ සම්බන්ධව ස්තුතිය පළ කරන බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසා සිටියේ ප්‍රිමික්ස් ව්‍යාපෘතියට ස්තුතිවන්ත වන බව ය.

**තීරණ අංක 03**
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග නඩත්තු කර ගෙන යාම දැනට ගැටළුවක් වීම හේතුවෙන් 2023 වර්ෂයේ සිට මෙම තත්වය නිරාකරණය කර ගැනීම සඳහා ප්‍රිමික්ස් නිෂ්පාදනය කර මාර්ග වල අලුත්වැඩියා කටයුතු කිරීමටත් , ඒ සඳහා අවශ්‍ය ඩබල් ඩ්‍රම් රථයක් ඇතුළු උපකරණ මිල දී ගැනීමටත් ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** 2022.11.30 දින පැවැත්වීමට නියමිත සාහිත්‍ය උත්සවය සඳහා රු.200,000.00 ක වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ රිල්හේන පන්සලේ අති උත්කර්ෂවත් ලෙස මෙම උත්සවය පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බවත් , උත්සවය සඳහා ගරු ආණ්ඩුකාරතුමා සහභාගී වන බවත් , මෙය සාර්ථක කර ගැනීම සඳහා පුද්ගලික ආයතන , බැංකු සහ මැණික් ව්‍යාපාරිකයන් සභාව සමඟ එකතු වී සහයෝගය ලබා දීමට කැමැත්ත පළ කර ඇති බවත්

, අඩු ආදායම්ලාභී දරුවන් 100කට තෑගි පාර්සල් ලබා දීම සඳහා එවැනි දරුවන් පිළිබඳව තොරතුරු ලබා දෙන ලෙස විදුහල්පතිවරු දැනුවත් කර ඇති බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ දරුවන් වෙනුවෙන් කරන දෙයක් නිසා අඩුපාඩුවක් නැතිව හැකි උපරිමයෙන් ම කරන ලෙසත් , මෙය යුගයේ අවශ්‍යතාවයක් බවත් , ව්‍යාපාරිකයන්ගේ සහයෝගය ලබා ගැනීම වටිනා බවත් , කියවීම ඉතා වැදගත් බවත් , සාර්ථක වූ සෑම කෙනෙක් ම කියවීමට රුචිකත්වය දැක්වූ අය බවත් , වත්මනෙහි පාඨක සමාජ වල දියුණුවක් නොමැති බවත් , අතීතයේ පාඨක සමාජ වල මීට වඩා වර්ධනයක් පැවති බවත් , පෙර කාලයේ ලලිත් එස්.මෛත්‍රීපාල වැනි අය සාහිත්‍යට විශාල නැඹුරුවක් දැක්වූ බවත් , මාධ්‍ය වල ද විශාල ප්‍රචාරයක් පැවති බවත් , සියලු දෙනා ම මේ සඳහා ඕනෑ ම සහයෝගයක් දැක්වීමට කැමති බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ අඩු ආදායම්ලාභී දරුවන් පාසල් මට්ටමින් තෝරනව ද , වසම් මට්ටමින් තෝරනවාද යන්න සලකා බැලීම සුදුසු බවත් , අඩු ආදායම්ලාභී දරුවන් 100 කට වඩා තෑගි පාර්සල් ලබා දීමට හැකි නම් වටිනා බවත් ය.තව ද තමන් කාලයක සිට දරුවටන්ට මෙවැනි උපකාර සිදු කරන බවත් හැකියාව පැවතුනහොත් මේ සඳහා කිසියම් හෝ උපකාරයක් සිදු කිරීමට බලා පොරොත්තු වන බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමා අදහස් දක්වමින් විමසා සිටියේ අඩු ආදායම්ලාභී දරුවන් පාසල් මට්ටමින් තෝරා ගැනීම සිදු කරනවා ද යන්න ය.මක්නිසාද නාගරික පාසල් වල උදාහරණයක් ලෙස ර/ගන්කන්ද මධ්‍ය විද්‍යාලයේ ද අහිංසක දරුවන් සිටින බව ය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ ගරු මන්ත්‍රීවරුන්ටත් මේ සඳහා යම් කිසි උපකාරයක් කළ හැකි නම් අවස්ථාව පවතින බවත් , මන්ත්‍රීවරුන් අඩු ආදායම්ලාභී දරුවන්ව තෝරන්නට ගියහොත් එතන කිසියම් ගැටළුවක් මතු විය හැකි බැවින් හා අඩු ආදායම්ලාභී දරුවන් පිළිබඳව ගුරුවරුන් දන්නා නිසා පාසල් වල විදුහල්පතිවරුන්ට එම කාර්යය ලබා දීම සුදුසු බව ය.වත්මනෙහි පවතින තත්ත්වය හා සම්පත් සමඟ දිය හැකි උපරිම ප්‍රමාණය දරුවන් වෙනුවෙන් ලබා දෙන බවත් , අඩු ආදායම්ලාභී දරුවන් නම් ඕනෑ තරම් පාසල් වල සිටින බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ පාසල් දරුවන් දුරකතන වලට ඇබ්බැහි වීම නිසා විවිධ රෝගාබාධ වලට ලක් වී ඇති බවත් දේශකයෙක් ගෙනවිත් මාධ්‍යන් නිවැරදිව පරිහරණය කිරීම පිළිබඳව දැනුවත් කිරීමක් ලබා දීමත් සුදුසු බව ය.

දේශකයෙක් ගෙන්වා දැනුවත් කිරීමක් සිදු කරන බව ගරු සභාපතිතුමා පවසන ලදී.

<u>**තීරණ අංක 04**</u>
2022.11.30 දින පැවැත්වීමට නියමිත සාහිත්‍ය උත්සවය සඳහා රු.200,000.00 ක වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මලාපවාහනය සහ කසළ ශෝධනය හා ඒ සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවක් සකස් කිරීමටත් , ගරු මන්ත්‍රීවරුන් දෙදෙනෙක් ද ඇතුළුව අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් කමිටුවක් පත් කිරීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 05**</u>
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මලාපවාහනය සහ කසළ ශෝධනය හා ඒ සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවක් සකස් කිරීමටත් , ඒ වෙනුවෙන් පහත පරිදි අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් කමිටුවක් පත් කිරීමටත් ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

1. ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය
2. ආර්.කේ.කපිල ජගත් ගුණතිලක මයා- ලේකම්
3. ජී.ඒ.බී.ජී.ප්‍රේමරත්න මයා - ප්‍ර : ක : සේ : නිලධාරි
4. එස්.ආර්.මැණිකේ මිය - සංවර්ධන නිලධාරී
5. ආර්.ඒ.ඩී.ආර්.රණසිංහ මිය - සංවර්ධන නිලධාරී
6. කේ.පී.ආර්.පී.පතිරණ මයා - මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා
7. එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
8. බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

**06**. බහුකාර්යය සංවර්ධන කාර්යය සාධක බලකාය යටතේ අප සභාවේ රියදුරු වශයෙන් සේවය කරන එස්.එම්.සුජිත් කුමාර යන අය සාමාන්‍ය සේවාකාලයට අමතරව සේවා කරන කාලය වෙනුවෙන් 2022.02.24 දින නිකුත් කරන ලද DCSPT/14/P2/18/5 ලිපියට අනුව අතිකාල ගෙවීම සුදුසු බවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 06**</u>
බහුකාර්යය සංවර්ධන කාර්යය සාධක බලකාය යටතේ අප සභාවේ රියදුරු වශයෙන් සේවය කරන එස්.එම්.සුජිත් කුමාර යන අය සාමාන්‍ය සේවාකාලයට අමතරව සේවා කරන කාලය වෙනුවෙන් 2022.02.24 දින නිකුත් කරන ලද DCSPT/14/P2/18/5 ලිපියට අනුව අතිකාල ගෙවීම සුදුසු බවට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.**පළාත් පාලන ආයතන විසින් ආදාහන කටයුතු සේවාවක් ලෙස පවත්වා ගෙන යන බැවින් හා ඒ සඳහා සැලකිය යුතු වැය බරක් පළාත් පාලන ආයතන විසින් දරන බැවින් වැඩිහිටි හා ආබාධිත නිවාස වල නේවාසිකව සිට මිය ගිය අයගේ දේහයන් ගාස්තු රහිතව ආදාහනය කිරීමේ හැකියාවක් පවතී ද යන්න සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් විමසීමක් කර ඇත.ඒ සම්බන්ධව සුදුසු තීරණයක් ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ එම මිනිස්සු අසරණ අය නිසා ආදාහනයන් නොමිලේ සිදු කිරීම සුදුසු බව කණ්ඩායමේම අදහස බව ය.

පැල්මඩුල්ලෙහි පවතින වැඩිහිටි නිවාසයට සහනයක් දුන්නොත් හොඳයි යන මතයෙහි තමන් ද සිටින බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**තීරණ අංක 07**
පළාත් පාලන ආයතනයක් ලෙස අප සභාවට වැඩිහිටි හා ආබාධිත නිවාස වල නේවාසිකව සිට මිය ගිය සියලු අයගේ දේහයන් ගාස්තු රහිතව ආදාහනය කිරීම සඳහා විශාල වැය බරක් දැරිය නොහැකි වුව ද , උපකාරයක් ලෙස පැල්මඩුල්ල වැඩිහිටි නිවාසයේ නේවාසිකව සිට මිය ගිය අඩු ආදායම්ලාභී අයගේ දේහයන් සම්බන්ධව එම මිය ගිය තැනැත්තා අඩු ආදායම්ලාභී බවට මුල් පදිංචි ස්ථානයේ ග්‍රාම නිලධාරීගේ වාර්තාව ඉදිරිපත් කරන්නේ නම් පමණක් එම ආදාහනය පැල්මඩුල්ල ගල්ලෙපිට ආදාහනාගාරයේ ගාස්තු රහිතව සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**08.** තණබිම , බැරණ්ඩුව , ලෙල්ලොපිටිය පදිංචි අඩු ආදායම්ලාභී ඩී.ඩබ්.සුමනාවතී යන අයට වැසිකිලියක් සාදා ගැනීමට අවශ්‍ය ද්‍රව්‍යාධාර ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 08**
ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර තණබිම , බැරණ්ඩුව , ලෙල්ලොපිටිය පදිංචි අඩු ආදායම්ලාභී ඩී.ඩබ්.සුමනාවතී යන අයට වැසිකිළි ආධාර ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**09.**ගිරවෙල් කන්ද , කහවත්ත පදිංචි අඩු ආදායම්ලාභී ආර්.ඒ.ඉරේෂා කුමාරි යන අයට ජංගම වෙළෙඳ කුටියක් ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 09**
ස්ථානය පරීක්ෂා කර බලා ගිරවෙල් කන්ද , කහවත්ත පදිංචි අඩු ආදායම්ලාභී ආර්.ඒ.ඉරේෂා කුමාරි යන අයට ජංගම වෙළෙඳ කුටියක් ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**II. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමාගේ යෝජනා.**

**01.** පැල්මඩුල්ල බස් නැවතුම්පල ඇතුලත ඇති වෙළඳකුටි ඉන් ඉවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමා පවසා සිටියේ යෝජනාවකට පමණක් සීමා නොවී කටයුතු කළ යුතු බවත් , මේ සම්බන්ධව කටයුතු නොකළහොත් සභාවට විශාල ගැටළුවක් පැන නගින බවත් , දින කිහිපයකට පෙර මෙම ස්ථානයෙහි පරුෂ වචන කියමින් රණ්ඩුවක් ඇති වූ බවත් , පාසල් ළමුන්ටවත් එම ස්ථානයෙහි සිටිය නොහැකි තත්වයක් ඇති බවත් , එනිසා මෙම වෙළෙඳකුටි ඉවත් කළ යුතු බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සුරවීර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ දෙමාපියන්ට ළමයින් සමඟ බසයක් පැමිණෙන තුරුවත් සිටීමට නොහැකි තත්වයක් එම ස්ථානයෙහි ඇති බවත් , එනිසා අනිවාරයෙන් ම ඉවත් කළ යුතු බවත් ය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ පවතින මෙම ගැටළුකාරී තත්ත්වය මත කඩිනමින් ඉවත් කරන ලෙස දන්වා නිවේදනයක් යැවීම සුදුසු බව ය.

**තීරණ අංක 10**
පැල්මඩුල්ල බස් නැවතුම්පල ඇතුලත ඇති අනවසර වෙළඳකුටි කඩිනමින්ම ඉවත් කරන ලෙස දන්වා නිවේදන යොමු කිරීම සුදුසු බවට ඒකමතිකම සහා සම්මත විය.

**02.** බටලන්ද සිංහපුර වතුර ටැංකියට යන මාර්ගය ඉතාමත් අබලන්ව ඇති බැවින් කඩිනම්ව ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ පිම්‍රික්ස් ව්‍යාපෘතිය ආරම්භ කළ පසු සියලු පාරවල් වල ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන බව ය.

**තීරණ අංක 11**
ප්‍රිමික්ස් නිෂ්පාදනය කර මාර්ග වල අලුත්වැඩියා කිරීම් කටයුතු ආරම්භ කළ පසු, ඉතාමත් අබලන්ව ඇති බටලන්ද සිංහපුර වතුර ටැංකියට යන මාර්ගය කඩිනම්ව ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ඒකමතිකම සහා සම්මත විය.

**03.** ඉදිකැටිය යටපාර තුම්මං හන්දිය අසල බොක්කුව සඳහා සිලින්ඩර් ( 8x2) 02ක් ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 12**
ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර , ඉදිකැටිය යටපාර තුම්මං හන්දිය අසල බොක්කුව සඳහා සිලින්ඩර් ( 8x2) 02ක් ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**හදිසි යෝජනා.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය.**

**01.** ඉහල බෝපිටිය වසමේ පදිංචි ර/ගන්කන්ද මධ්‍ය විද්‍යාලයෙහි අධ්‍යාපනය හදාරන ඩී.ඩබ්.එම්.මයෝමි හසනිකා මුතුකුමාර යන ශිෂ්‍යාව “ ජාත්‍යන්තර කොරියානු අධ්‍යාපන පදනම ” මඟින් සංවිධානය කරන භාෂා පුහුණු වැඩසටහනකට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වන්නට සූදානම් වන අතර කොරියානු රටේ පවතින සීතල දේශගුණික තත්වයට ඔරොත්තු දෙන පාවහන යුගලයක් මිල දී ගැනීම සඳහා විශාල මුදලක් වැය වන බැවින් රු.10,000.00 ක පමණ මුදල් ආධාරයක් ලබා දෙන ලෙස ඇයගේ මව වන එල්.ඒ.ඩී.එස්.ළිඳවත්ත මිය කළ ඉල්ලීම සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය පවසා සිටියේ ර/ගන්කන්ද මධ්‍ය විද්‍යාලයේ කොරියානු භාෂාව නැතත් , මෙම දරුවා ජයග්‍රහණය කර ඇති නිසා අගය කළ යුතු බව ත් ය.

**<u>තීරණ අංක 13</u>**
ඉල්ලීමේ ලිපිය හා ග්‍රාම නිලධාරී වාර්තාව , ජාත්‍යන්තර කොරියානු අධ්‍යාපන පදනමේ සභාපති විසින් එවා ඇති ලිපිය සලකා බලා , ඉහල බෝපිටිය වසමේ පදිංචි ර/ගන්කන්ද මධ්‍ය විද්‍යාලයෙහි අධ්‍යාපනය හදාරන ,“ ජාත්‍යන්තර කොරියානු අධ්‍යාපන පදනම ” මගින් සංවිධානය කරන භාෂා පුහුණු වැඩසටහනකට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වන්නට සූදානම් වන ඩී.ඩබ්.එම්.මයෝමි හසනිකා මුතුකුමාර යන ශිෂ්‍යාවට කොරියානු රටේ පවතින සීතල දේශගුණික තත්වයට ඔරොත්තු දෙන පාවහන් යුගලයක් මිල දී ගැනීම සඳහා රු.10,000.00 ක පමණ මුදල් ආධාරයක් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ඇතිව සභා අරමුදලින් ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමා.</u>**

01. කහවත්ත - පැල්මඩුල්ල නගර සැලැස්ම සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමේ සාකච්ඡාමය වැඩසටහන 2022.11.04 දින පැවති අතර එහි දී කඩිනමින් මෙම සැලැස්ම සඳහා සභා අනුමැතිය ලබා ගත යුතු බවට සාකච්චා විය.නමුත් එදින වනවිට අද දින පැවැත්වෙන ( 2022.11.10 ) සභාවට අදාල මහා සභාවේ න්‍යාය පත්‍රය සමඟ සියලු වාර්තා ගරු මන්ත්‍රීවරුන්ට ලබා දී තිබූ බැවින් “ කහවත්ත - පැල්මඩුල්ල නගර සැලැස්ම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ” කල් දී ඇති යෝජනා ලෙස න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීමට නොහැකි වූ අතර හදිසි යෝජනා යටතේ සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 14</u>**
පැල්මඩුල්ල - කහවත්ත නගර සංවර්ධන සැලැස්ම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**09. කාරක වාර්තා සලකා බැලීම - 2022-10-13 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව හා 2022-10-13 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව අනුමත කිරීම.**

2022-10-13 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව හා 2022-10-13 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**10. 2022-10-01 සිට 2022-10-31 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව සලකා බැලීම.**

2022-10-01 සිට 2022-10-31 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගිති වාර්තාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමාය විසින් ස්ථිර කරන ලදී.

**11. වෙනත් කරුණු.**

- **සභාව දැනුවත් කිරීමේ නිවේදන හා අදහස් දැක්වීම්.**

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ 2022 වර්ෂයේ දෙසැම්බර් මස පැල්මඩුල්ල ගල්පොත්තාවෙල විහාරස්ථානයේ සිට සමන්දේව ප්‍රතිමා වහන්සේ වැඩමවීමේ පෙරහැර පැවැත්වෙන බවත් , ඒ වෙනුවෙන් පැල්මඩුල්ල ප්‍රධාන මාර්ගය පිරිසිදු කිරීමේ කටයුතු අප සභාවට පැවරී ඇති බවත් , 2022.11.25 දින පැල්මඩුල්ල ප්‍රධාන මාර්ගය දෙපස පිරිසිදු කිරීමේ ශ්‍රමදාන කටයුත්තක් සූදානම් කර ඇති බවත් , සැරසිලි කටයුතු හා අනෙකුත් අවශ්‍යතා සඳහා හදිසි මිල දී ගැනීම් මගින් ද්‍රව්‍ය මිල දී ගැනීමට සිදු විය හැකි බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ ශ්‍රී පාදස්ථානය බෞද්ධයන්ගේ මුදුන් මල්කඩ බවත් , මෙම පෙරහැර වෙනුවෙන් පැවරී ඇති වගකීම් හා සැරසිලි කටයුතු සිදු කිරීම ඉතා වටිනා බවත් , මෙම පෙරහැරට වන්දනාමාන කිරීමට වෙනත් ප්‍රදේශ වල ජනයා සති ගණන් බලා සිටින බවත් , සියලුදෙනාම එකතු වී අවශ්‍ය කටයුතු සිදු කරමු යන්නත් ය.

තව දුරටත් අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ ඡන්දය පරමාධිපත්‍ය බලයක් බවත් , අනවශ්‍ය වෙනත් දේවල් වෙනුවෙන් වැය කිරීමට මුදල් ඇත්නම් මැතිවරණය පැවැත්වීමටත් මුදල් තිබිය යුතු බවත් , අද අවර්ණ පැහැයෙන් මහා සභාව සඳහා විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් පැමිණියේ මැතිවරණය නොපැවැත්වීමට විරෝධය පල කර බවත් , වත්මනෙහි ජනතාව අපහසුවෙන් ජීවත් වන බවත් , අනිවාර්යෙන් ම පළාත් පාලන මැතිවරණයක් පැවැත්විය යුතු බවත් , නැතිනම් මහපාරේ උද්ඝෝෂන සිදු කරන බවත් , අවසාන වශයෙන් ජනතාව මැතිවරණයේ දී සාධාරණ හොඳ තීරණයක් ලබා දෙනු ඇතැයි කියාය.

ඊට අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමාගේ යෝජනාවට තමන් ද එකඟ බවත් , තමන් ද ඡන්දය පවත්වන ලෙස ඉල්ලා සිටින බවත් , සභාවල් විසිරුවාහරින විටම ඡන්දයක් පවත්වන ලෙස රජයෙන් ඉල්ලා සිටින බවත් , ජනතාවගේ තීරණය එවිට බලා ගත හැකි බවත් , සුදුසු තීරණයක් ජනතාව ලබා දෙනු ඇතැයි බලාපොරොත්තුවෙන් සිටින බවත් , ඉදිරි ඡන්ද වලදීත් පොදු ජන පෙරමුණ ලෙස එකට කටයුතු කරන බවත් ය.

- **පසුගිය සභාවේ ලබා ගත් තීරණ සම්බන්ධයෙන් ප්‍රගිතිය සාකච්ඡා කිරීම.**

2022.10.13 දින මහා සභාවේ ප්‍රගතිය ඉදිරිපත් කරමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ පිටියවත්ත ඉඩමෙහි සිටින පවුල් වල තොරතුරු ලබා ගැනීම සඳහා සමීක්ෂණයක් සිදු කළ අතර ඒවා තක්සේරු දෙපාර්තමේන්තුවට යවා වාර්ෂික බදු ක්‍රමයක් හඳුන්වා දීමට කටයුතු කරන බව ය.තව ද පැල්මඩුල්ල ප්‍රදේශයේ ආරම්භ කිරීමට සූදානම් වන වීදි ආහාර ( Street food ) ව්‍යාපෘතියෙහි ස්ථාන පරීක්ෂාව 2022.11.02 දින සිදු කළ අතර කාර්මික නිලධාරීතුමාට ඇස්තමේන්තු සකස් කිරීමට යොමු කර ඇති බව ය.2022.11.30 දින අති උත්කර්ෂවත් ලෙස ගරු ආණ්ඩුකාරතුමාගේ සහභාගීත්වයෙන් සාහිත්‍ය උත්සවය පැවැත්වීමට සියලු කටයුතු සංවිධානය කරමින් පවතින බව ය.

- **නිවාඩු අනුමත කිරීම.**

අසනීප තත්ත්වය හේතුවෙන් සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ඇති ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමාහට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

- **මීළඟ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම.**

මහා සභාව 2022 දෙසැම්බර් මස 08 වන දින පැවැත්වීමට තීරණය විය.

- **සභාපතිතුමාගේ ස්තුති කතාව.**

අද දින සභාවට පැමිණ සිටින ගරු විපක්ෂනායකතුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත් , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් , මාධ්‍යවේදී මහතාටත් ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමාගේ ස්තුති කතාව අවසන් කරන ලදී.

පෙ.ව.11.00 පමණ සභාවේ කටයුතු අවසන් විය.

2022-11-16 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදීය.

ලේකම්
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

ප්‍රාදේශීය සභා .................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ....................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

2022-12-08 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව